# දන් දී දිව්‍යමය හෝ මිනිස් ආයුෂ වර්ණ සැප බල ප්‍රඥා ලබන්න

## භොජන සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 3 - පිටු අංක 64 - 65)

බොජුන් දන් දෙන දායකයා දන් ලබන්නාට පස් කරුණක් දෙන්නේ වෙයි.

1. ආයුෂය දෙයි.
2. වර්ණය දෙයි.
3. සැපය දෙයි.
4. බලය දෙයි.
5. ප්‍රඥාව දෙයි.

මෙසේ දන් දෙන දායකයා විසින් දන් ලබන්නාට,

- ආයුෂය දී දිව්‍යමය හෝ මනුෂ්‍ය ආයුෂයට හිමිකරුවෙක් වෙයි.
- වර්ණය දී දිව්‍යමය හෝ මනුෂ්‍ය වර්ණයට හිමිකරුවෙක් වෙයි.
- සැපය දී දිව්‍යමය හෝ මනුෂ්‍ය සැපයට හිමිකරුවෙක් වෙයි.
- බලය දී දිව්‍යමය හෝ මනුෂ්‍ය බලයට හිමිකරුවෙක් වෙයි.
- ප්‍රඥාව දී දිව්‍යමය හෝ මනුෂ්‍ය ප්‍රඥාවට හිමිකරුවෙක් වෙයි.

ප්‍රඥාවන්ත දායකයා ආයුෂය, වර්ණය, සැපය, බලය, ප්‍රඥාව දෙන්නේ වෙයි. ඒ නුවණැත්තා සැපයට පැමිණෙයි. මේවා දී යම් යම් තැනක උපදින්නේ නම් දීර්ඝායුෂ ඇති යසස් ඇත්තෙක් වෙයි.